Page 7 July 2010.qxd 24/07/2010 14:52 Page 1





## VENUS FLYTRAP

A gentle fly buzzes
into the sweet plant
The hum of wasps rise
to a quickened chant…
The scent is sickeningly
irresistible
The fly becomes uncontrollable
As he zooms into the plant…
It glides into a sticky pool
And then a breeze comes cool..
And then he utters his
final breath
And enters the doors of death...!


♦ **Ravindu Ranawaka**
**Simi Valley CA, USA**

## Oh No !

Oh No! I don't know
How to row my boat
Oh there's a stick
It is a thick stick…
Now I can row
My boat…
The wind is blowing to my face
Now I can row my boat….

♦ **Hiruni Ranawaka**
**7 years**
**Simi Valley, CA, USA**

**Send your poetry and short essays to this Children's Corner by post, fax or e-mail.**




## The World's Largest School
## ලොව විශාලතම පාසැල

The world's largest school is City Montessori. The mixed - sex private establishment has 26,312 students on 26 campuses in Lucknow, India. It takes pupils from the age of three up to the Indian equivalent of A-levels. It's a far cry from the school's launch in 1959. Then it was in rented premises with only five scholars

අද ලොව ඇති විශාලතම පාසැල සිටි මොන්ටිසෝරි නම් වේ. මිශ්‍ර පාඨශාලාවක් වන එහි ශිෂ්‍ය ශිෂ්‍යාවෝ 26,312 ක් ඉගෙනගනිති. විද්‍යාල 26 කින් සමන්විත මෙම පාසැල පිහිටා ඇත්තේ ඉන්දියාවේ ලක්නව් නගරයේය. එයට 3 වසර සිට ඉහළම පන්තිය වූ අධ්‍යාපන උසස් පෙළ දක්වා සිසුන් ඇතුළත්කර ගන්නා බව පැවසේ. මෙම පාසැලේ අද ඇති දියුණු තත්වය එය 1959 දී ආරම්භ කළාට වඩා හාත්පසින්ම වෙනස්ය. ඒ මුල් අවධියේ මෙය කුලියට ගත් කුඩා ගොඩනැගිල්ලක් වූ අතර, එදා එහි සිටියේ බාලාංශ පන්ති සිසුන් 5 දෙනෙකු පමණි.

♦ ***Auntie Ramani ( රමණී නැන්දා)***

## හෙට දින නුඹේ !

අහස් කුසේ නිල් තරු කැට ඇත දිළිලා
තණ නිල්ලේ සුදු පිනිකැට වැහි වැහැලා
සිහිල් සුළඟ යනවා ඇඟ දැව ඊලා
සඳ බැසයයි හිරු කුමරුට ඉඩ දීලා

පාන්දරම කම්මැලිකම නැලු සිතේ
පුංචි පුතුන්ගේ පොත පත ඇත සුරතේ
කුරුළු ගීත මුසු සැනසිලි සුවය ගතේ
සිතට වැටුණු පාඩම නොමැකේවි පුතේ

නිදි යහනේ සිහිනෙන් මෙලොවට නැගිලා
නිතියෙන් අකුරු උගනිව් අලසින් මිදිලා
හිනැහෙන විටදි මතු දින තරුසේ දිදුලා
සැණෙකින් යයි අහසේ තරුවැල් මැකිලා

♦ **හේමා ප්‍රියංගනී**
**ගිරිතලේගම ම ඕ.**
**පොළොන්නරුව Sri Lanka**


ලංකා බැංකුව
BANK OF CEYLON
ඔබට විශ්වාස තැබිය හැකි බැංකුවයි

## ලන්ඩන් ශාඛාව

**ඔබේ මුදල් ගාස්තුවකින් තොරව සුරක්ෂිතව හා විශ්වාසදායකව ශ්‍රීලංකාවට ප්‍රේෂණයකිරීමේ මහඟු අවස්ථාවක් !**

✳ ලංකා බැංකුවේ ලන්ඩන් ශාඛාව මගින් ශ්‍රීලංකාවේ ලංකා බැංකු ශාඛාවන්හි පවත්වාගෙන යනු ලබන ඕනෑම ගිණුමකට ඔබත් ගාස්තුවකින් තොරව මුදල් ප්‍රේෂණය කරන්න.


✳ ඔබගේ ඉතුරුම් වෙනුවෙන් ලංකා බැංකුවේ අනේවාසික විදේශ ගිණුමක් (NRFC) ආරම්භකර පවුම් වලින් මුදල් ප්‍රේෂණය කර පහත සඳහන් ප්‍රතිලාභ ලබාගන්න.

1. පවුම් වලින්ම පොළිය ලබාගැනීම.
2. ගිණුමේ ඇති මුදල් නිදහසේ ඕනෑම අයෙකුට හෝ විදේශ රටක ඇති ගිණුමකට ප්‍රේෂණය කිරීමේ හැකියාව.
3. NRFC ගිණුම මාර්ගයෙන් මුදල් ප්‍රේෂණය කිරීමෙන් උපරිම විනිමය අනුපාතිකයක් රුපියල් සඳහා ලබාගැනීමේ හැකියාව.

*ලංකා බැංකුවට පැමිණීමෙන් හෝ* HSBC, NATWEST, BARCLAYS *බැංකු වලින් අපගේ පහත සඳහන් රැස්කිරීමේ ගිණුම්වලට මුදල් බැර කිරීමෙන් අනතුරුව අපව අමතන්න.*

HSBC - Sort Code : 40 - 05 - 15 A/C - 00491624
NatWest - Sort Code : 60 - 00 - 04 A/C - 04607732
BARCLAYS - Sort Code : 20 - 32 - 53 A/C - 80113859

**No 1, Devonshire Square, London EC2M 4WD**
**Phone : 020 7377 1888 Fax: 020 7377 5430**
**e-mail : bankofceylon.uk@btclick.com**
**Our Web - www.boc.lk**
**Nearest railway station - Liverpool Street (tube & rail) Bishop Gate Exit**

## පොතක් පතක්
### සංවේදනා (කවි)




**මා** බොහෝ කලක් පුරා හොඳින් හඳුනන මධුරි අබේවික්‍රම කිවිඳිය විසින් රචනා කරන ලද නොබෝ දා මුද්‍රණයෙන් නිකුත් වූ සංවේදනා නම් කාව්‍ය සංග්‍රහය මා අතට පත්විය. සංවේදනා දොරට වැඩීමේ උත්සවයක් දැනට සති කීපයකට පෙර කොළඹ පුස්තකාල ශ්‍රවනාගාරයේ දී සිදුවූ බව මම ඇසූයෙමි. එසේම එම උත්සවයට කවීන්, ලේඛකයින්, පුවත්පත් කලාවේදීන් ඇතුළු විද්වතුන් රාශියක් සහභාගි වූ බව ද දැන ගන්නට ලැබිණ. නාට්‍ය ශිල්පීන් වන ජයලත් මනෝරත්න, නිශ්ශංක දිද්දෙණිය, ප්‍රවීන පත්‍ර කලාවේදී මෙන්ම සුභාවිත කිවිකමින් අනූන තිලකරත්න කුරුවිටබණ්ඩාර, හා කවියෙකු ගීත රචකයෙකු වන ආචාර්‍ය ප්‍රනීත් අබේසුන්දර යන මහත්වරු කාව්‍ය සංග්‍රහය අගයමින් දේශන පැවැත්වූ බව ද වාර්තාවිය.

ලංකාවිත්ති පුවත්පතේ නිර්මාණ පිටුවට කලක් තිස්සේ මධුරි අබේවික්‍රම කවි ලියන්නීය. එනිසා ඇයගේ කාව්‍යමය අදහස් හා සාහිත්‍යය පිළිබඳ උසස් දැනුම මම හොඳින් වටහාගෙන ඇත්තෙමි.

කවිය කෙනෙකුගේ හදබස හෝ හෘදයාංගම ප්‍රකාශනය වශයෙන් සමහර විචාරකයෝ හඳුන්වති. එමතු ද නොව කවිය කිසියම් ජාතියක හදබස ලෙසද හඳුන්වා දී ඇත. සිංහල කවිය ගැන කතාකරන කල්හි මේ කියමන් සැබෑ බව අපට වැටහේ. කවියෙන් ප්‍රකාශකර ඇති බොහෝ දේ අප සමාජයේ ජනතාව අතර චිරාත් කාලයක් පුරා පවතින්නට හේතුව ඒ නිසාම නොවේද?

කුඩා කල දරුවන් නළවන්නේ නැළ විලි කවියකිනි. කෙතේ කුඹුරේ අස්වැන්න නෙලන්නේ ගොයම් කවියකිනි. ප්‍රේමය ප්‍රකාශ කරන්නට ද කවිය උපයෝගීකර ගනිති. ව්‍යසනයකදී දෙවියන්ගේ හා ග්‍රහයන්ගේ පිහිට පතන්නේ සෙත් කවියකිනි. එසේම කෙනෙකු විපතේ හෙලන්නටද ඇතැම්හු වස්කවිය යොදාගනිති. මරණයකදී අප ජනතාව ශෝක වන්නේ කවිවලිනි. එයට ශෝකප්‍රකාශයයි කියති. එසේම මරණයෙන් පසුව වුව ද දුක තුනීකර ගන්නේ අවමඟුල සිදුවූ ගෙදර වෙස්න්තර ජාතක කවි හඬ නගා කියවීමෙනි.

මේ අයුරින් ලංකා ජන ජීවිතයේ විශේෂ අවස්ථාවන් සඳහා කවිය උපයෝගී කරගෙන ඇති අයුරු පැහැදිලි වේ.

බොහෝ කලක් එංලන්තයේ වසන්නේ නමුදු මධුරිගේ කවි සිත සැරිසරා ඇත්තේ තම මව්බිම වන ශ්‍රීලංකාවේ බව ඇයගේ කාව්‍ය නිර්මාණයන් දෙස බලන කල පැහැදිලි වේ. ඒ පරිසරයේ දී ගෙවූ ජීවිතයේ තමා ලද අත්දැකීම් සටහන් කිරීමට ඇය ගෙන ඇති වෑයම ද එය සාර්ථක ලෙස ඉටුකර ඇති ආකාරයද ඉන් දැකිය හැක. පරිසරය, ඇසුරු කළ අය සහ තමාට



මධුරි අබේවික්‍රම

මුහුණ දෙන්නට වූ අවස්ථාවන් දෙස ඇය දාර්ශණිකව බලයි. තමා දකින දෙයට කිසියම් නව අරුතක් එක් කිරීම කවියෙකුගේ ස්වභාවය ද වේ.

ගම සහ ළමාවිය නමැති කවි පන්තියේ ඇය සොබදෙහම දකින්නේ මෙසේ ය.

ගංගා ගලයි ගහ කොළ වෙත සෙනෙහෙ පපා
ගස් වැල් රහයි පිපි මල්වල සුවඳ පපා
සියොතුන් හඬයි රස පලවැල යසට හපා
සවසට නැගෙයි පිරි පුන් සඳ කන්ද කපා

පෝදා අසිරිය යනුවෙන් මධුරි ලියා ඇති කවි පෙළ ගැමි සිතක පමණක් ජනිත විය හැකි සිතුවිලි සමුදායක් තුළින් පහළ වන කාව්‍ය චින්තාවකි. පිටිසර ජන ජීවිතයේ අපූර්වත්වය විදහාපාන රූපමාලාවක් ඒ කවි අප සිත්හි මවන්නට සමත් ය. ඒ එක් කවක් මෙසේ වෙයි.

## Sanvedana
### (Sense & Sensation)
### an anthology of poems
### by Madhuri Abeywickrema

**මධුරි අබේවික්‍රම කොළඹ විශ්වවිද්‍යාලයේ සහ නීති විද්‍යාලයේ උපාධිධාරිනියකි. සාහිත්‍ය, සංගීතය, නාට්‍ය හා ලේඛන කලාව කෙරෙහි විශේෂ උනන්දුවක් දක්වන්නියකි. මධුරි එක්සත් රාජධානියේ නීතිඥ වෘත්තියේ නියැලී සිටී.**

ඇත වෙලේ ගස් මුදුනේ
වවුලන්ගේ හඬ ඇහෙන ව
වැව මත්තේ පිපෙන කුමුදු
සුවඳ අරන් සුළඟ එන ව
සාංඨාර හඬ සමගින්
පන්සල් බිම මතක් වෙන ව
සුදු ඇඳගෙන සැදැහැතියන්
වෙහෙර දෙසට පා නගන ව

කවිය ආයාසයෙන් උගතු යුතු දෙයකට වඩා එය ස්වභාවයෙන් කෙනෙකු තුළ පිහිටන හැකියාවක් බව සිතන්නට මා කැමතිය. එම හැකියාව ඇති අය ලෝකය විචිත්‍රව දකිති. එසේම වහා කම්පනය වන හදවතක් කාව්‍ය කාරයාට හෝ කාව්‍යකාරියට ඇත. කවියක් බිහිවන්නේ ඒ තුළිනි. කවි කිවිඳියන් මිනිස් සමාජයේ දුර්ලභ වන්නට හේතුවද ඒ කරුණ මය. එබැවින් කාව්‍යකරණයට හුරුවීම පින් ඇති බව ප්‍රකට කිරීමක් ලෙසට ද සැලකුව හොත් එහි වරදක් ද නැත.

කාව්‍ය ප්‍රකාශනවලට අද ඇති ඉල්ලුම සීමාසහිත ය. නවකතා පළවන වේගයෙන් කවිපොත් පළ නොවේ. කවිය ක්‍රමයෙන් ජන සමාජයෙන් පලා යාවිදෝයි සැකයකි. එනිසා කිසියම් කෙනෙකු කවි මගෙහි යනු දැක්ම මම නිබඳ අපේක්ෂා කරමි. මධුරි අබේවික්‍රම ගේ සංවේදනා කාව්‍ය සංග්‍රහය සිංහළ කවිකෙත පෝෂණය කරන්නට ගත් මහඟු ප්‍රයත්නයක් වශයෙන් සිතමින් කවිමග තව තවත් ඉදිරියට යන්නට ඇයට සුබ පතමි.

♦ ***දයා ආනන්ද***


**Srilanka Information Sites ශ්‍රී ලංකා තොරතුරු අඩවි**
**www.srilankans.com www.srilankatours.co.uk www.srilanka-holidays.co.uk**